ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය සහයෝගය යටතේ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

2024 ජනවාරි 7 වන දින ප්‍රවාහන, මහා මාර්ග සහ ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ගල්ගමුව දුම්රිය ස්ථානයේ දී මහව සිට අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ ඒ ආශ්‍රිත කටයුතු සමාරම්භ කළහ. මෙය ඇමරිකානු ඩොලර් මිලියන 318ක ඉන්දීය ණය පහසුකමක් යටතේ ඉන්දියාවේ රාජ්‍ය සමාගමක් වන IRCON සමාගම විසින් මහව සිට ඕමන්තේ දක්වා කිලෝ මීටර් 128ක දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියේ දෙවන අදියර වේ. මෙම සමස්ත ව්‍යාපෘතියේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 91.27ක් වන අතර මහව සිට අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ දෙවන අදියර මාස 6ක කාලයකදී අවසන් කිරීමට නියමිතය. ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය ශාන්ත බණ්ඩර සහතා සහ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. මෙම අවස්ථාව අමතමින් ප්‍රවාහන අමාත්‍යතුමා විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකාවට ලබාදෙන සහයෝගය සම්බන්ධයෙන් ඉන්දියාවට සිය ස්තූතිය පළ කළේය. පසුගිය වසර කිහිපය තුළ IRCON සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකළ වැඩ කටයුතු අගය කළ එතුමා දෙරට දුම්රිය ක්ෂේත්‍රය තුළ වඩා ශක්තිමත් සහයෝගීතාවයක් ඇති කළ යුතු බව සඳහන් කළේය.

3. මේ අතර මහ කොමසාරිස්තුමා සඳහන් කළේ ඉන්දියාව ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සංවර්ධන සහකරුවකු වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා සහ අවශ්‍යතාවයන්ට අනුව පසුගිය වසර කිහිපය තුළ දිවයිනේ

උතුරු සහ දකුණු දුම්රිය මාර්ගයන් සංවර්ධනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවා ඇති බවයි. ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ සහ සේවා ප්‍රවාහනය ඉහළ නැංවීම සඳහා දුම්රිය මාර්ග නවීකරණය කිරීමේ වැදගත්කම අවධාරණය කළ එතුමා එය ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය කිරීමට ද ඉවහල් වන බව ප්‍රකාශ කළේය.

4. ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගය තුළ දුම්රිය ක්ෂේත්‍රය ප්‍රමුඛ අංශයකි. මේ දක්වා ඉන්දියාව ණය පහසුකම් 5ක් යටතේ ඇමරිකානු ඩොලර් බිලියනයකට අධික වටිනාකමකින් යුත් ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය තුළ ක්‍රියාවට නංවා ඇත. ඉන්දියාවේ රාජ්‍ය සමාගමක් වන IRCON සමාගම 2009 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් කටයුතු ඇරඹූ අතර උතුරු පළාත තුළ සමස්ත දුම්රිය මාර්ග ජාලයක් (කිලෝ මීටර් 253) යළි ඉදිකරමින් සහ දකුණු දුම්රිය මාර්ගය (කිලෝ මීටර් 115) ප්‍රතිසංස්කරණය කරමින් ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග නවීකරණ කිරීම සඳහා දයකත්වය ලබා දී ඇත. එසේම, කිලෝ මීටර් 330ක දුම්රිය මාර්ගයක් සඳහා නවීන සංඥා සහ විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපනය කරමින් දුම්රිය ප්‍රවාහනයේ ආරක්ෂාව සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා ද IRCON සමාගම දයකත්වය ලබා දී ඇත.

5. 2022 අප්‍රේල් මාසයේදී ණය නොගෙවන බවට ශ්‍රී ලංකා රජය විසින් නිවේදනය කර තිබියදී පවා විවිධ ණය පහසුකම් යටතේ ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් සහයෝගය අඛණ්ඩව හිමි වීම විශේෂ කරුණකි. 2023 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යංශය සහ IRCON ඉන්ටර්නැෂනල් සමාගම ඉන්දීය ණය පහසුකමක් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 14.90ක පිරිවැයකින් මහව සිට අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ගය සඳහා සංඥා පද්ධතියක් නිර්මාණය කිරීමට, ස්ථාපිත කිරීමට, පරීක්ෂා කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට නව ගිවිසුමක් අත්සන් කළේය.

***

**කොළඹ**
2024 ජනවාරි 07